# කුමන්ත්‍රණකාරී බලවේග පරාජය කළ යුතුයි



සුනාමි විපත හමුවේ බහුතරයක් එ.ජා.ප. නායකයන් පවා ඉතා ම වගකීමකින් කටයුතු කරන මොහොතක එම පක්ෂයේ සුළුතරයක් විසින් ගෙන යනු ලබන අවස්ථාවාදී දේශපාලනය පිළිබඳව මහජන විරෝධය පළ වී ඇතැයි නිවේදනයක් නිකුත් කරමින් අමාත්‍ය මංගල සමරවීර මහතා පෙන්වා දෙයි.

මෙවැනි ජාතික ව්‍යසනයක දී පටු දේශපාලන උවමනාවන් වෙනුවෙන් පෙළගැසී සිටින කුමන්ත්‍රණකාරී බලවේග පරාජය කිරීමට රටට දැයට ආදරය කරන සියලු බලවේග එක් විය යුතු කාලය එළඹ ඇතැයි ද එම නිවේදනයේ තවදුරටත් සඳහන් වේ. ඇමැතිවරයා විසින් නිකුත් කරනු ලැබූ සම්පූර්ණ නිවේදනය මෙසේය.

අප රට ශීඝ්‍ර සංවර්ධනයට යොමු කරවීම සඳහා, අප රටේ ජනතාව පක්ෂ බේදයෙන් තොරව සීමාසහිත කාලයකට හෝ අත්වැල් බැඳ ගනිමින් ඉලක්ක සහගත ජාතික ප්‍රතිපත්තියක් තුළ කටයුතු කළ යුතු බවට ජනාධිපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනිය පසුගිය දස වසර තුළ විටින් විට අවධාරණය කර ඇත. සුනාමි ඛේදවාචකයේ අමිහිරි අත්දැකීම්වලින් පසුව හෝ අප රටේ බහුතරයක් දේශපාලන පක්ෂ මේ රට යළි ගොඩනැගීමට නම් සියලු දේශපාලන පක්ෂ වාදබේද පසෙක ලා ඒකරාශී විය යුතු බවට එතුමිය එදා දැරූ මතයට එකඟ වූ සුභවාදී ප්‍රතිචාරයක් දක්වා තිබීම මේ රටේ සුවහසක් ජනතාව ගේ ප්‍රසාදයට හේතු වී ඇත. බහුතරයක් ශ්‍රී ලාංකික ජනතාව ගේ සුභවාදී වූ එම ප්‍රාර්ථනය අනුමත කරමින් එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා ද ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ විවිධ ප්‍රකාශ කර ඇත. විපක්ෂ නායකවරයා ගේ ප්‍රකාශයන්ට අනුකූලව එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක කරු ජයසූරිය මහතා ජනාධිපතිතුමිය විසින් නම් කරන ලද ප්‍රධාන ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයකු ලෙස ඉතා උනන්දුවෙන් කටයුතු කරන අතර ම හිටපු අමාත්‍ය මිලින්ද මොරගොඩ වැනි ජ්‍යෙෂ්ඨ නායකයන් ද මෙම මතය අනුමත කරමින් ප්‍රකාශ පවා නිකුත් කර ඇත.

සුනාමි ඛේදවාචකයෙන් විපතට පත් කලාපයේ අන් සියලු ම රටවලට වඩා කාර්යක්ෂමව, මේ විපතින් ආපදාවට පත් ජනතාව ගේ සුබසාධනය සඳහා ඵලදායී කටයුතු රැසක් ඉටු කිරීමට ශ්‍රී ලංකාවට හැකි වූ බව එක්සත් ජාතීන් ගේ සංවිධානය පවා පිළිගෙන තිබේ. මං මාවත් පිළිසකර කිරීම, දුරකථන, ජල විදුලිය, රෝහල් ආදී යටිතල පහසුකම් හා සේවාවන් නැවත පණගැන්වීම, භාණ්ඩ බෙදා හැරීම වේගවත් කිරීම යනාදී කටයුතු දැනටමත් රජය විසින් නිසි පරිදි ක්‍රියාත්මක කර තිබේ. අවතැන්වූවන් වෙසෙන කඳවුරු නිසි පරිදි කළමනාකරණය කරමින් තිබේ. අවතැන්වූවන් වෙසෙන කඳවුරු නිසි පරිදි කළමනාකරණය කරමින් තිබේ. විපතට පත් ජනතාව ගේ සුබසාධනය සඳහා කළ යුතු කිසිවක් රජය අවතක්සේරුවට ලක් කර නැත.

ඉතිහාසයේ කිසිම දිනෙක සුළු හෝ භූමිකම්පාවක අත්දැකීම් අත්නොවිඳි ශ්‍රී ලංකාව අද මේ කලාපයේ අනෙක් රටවලට වඩා ඉක්මනින්, ඒ විනාශයට පත් වූ ප්‍රදේශ යථා තත්වයට ගෙන ඒමට ක්‍රියා කරන බව අප රටට දිගින් දිගට ම පැමිණෙන රාජ්‍ය නායකයන් ගේ හා ආධාර කණ්ඩායම්වල මතය වී ඇත. මෙම අභියෝගය ජය ගැනීම සඳහා ජනාධිපතිනිය ගේ මග පෙන්වීම යටතේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය සුවිශාල කාර්යභාරයක් ඉටු කරමින් සිටී.

විපතට පත් ජනතාවට ක්ෂණික පහසුකම් ලබා දීමට මේ වන විටත් රජයට හැකියාව ලැබී ඇතත්, බිඳ වැටුණු ජන ජීවිත හා රට යළි නගා සිටුවිය හැක්කේ, මේ සංක්‍රාන්තික ක්‍රියාකාරකම්වලින් ඔබ්බට ගිය පැහැදිලි ජාතික වැඩපිළිවෙළක් තුළින් පමණි. මේ විපතේ දි ශ්‍රී ලංකාවට ආධාර කළ ජාත්‍යන්තර ප්‍රජාව ගේ ද අදහස වන්නේ කල් පවත්නා විසඳුම් ඔස්සේ රට යථා තත්ත්වයට පත් කළ යුතු බවයි.

සුනාමි ඛේදවාචකයෙන් බිඳ වැටුණු අපේ රට යළි ගොඩනැගීම සඳහා අදියර කිහිපයකින් කටයුතු කළ යුතුව ඇත. එහි මුල් අදියරේ දී ජනතාවට ක්ෂණික සහන ලබා දීමට අප වෙහෙසුණෙමු. මේ වන විට එම අභියෝගය අප බොහෝ දුරට ජය ගෙන ඇත්තෙමු. දැන් අප දෙවන අදියර කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. එම අදියර තුළ අප නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරමින් විනාශ වූ ප්‍රදේශ පමණක් නොව මුළු රට ම සංවර්ධනය කරා යොමු කරන ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු ය. ඒ සඳහා වන මූලික සැලැස්මක් ඉදිරි දින කිහිපය තුළ රජය විසින් ඉදිරිපත් කිරීමට නියමිත ය. එහි දී විනාශයට පත් වූ ප්‍රදේශවල නව නිවාස යෝජනා ක්‍රම, පාසල් ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ලබා දීමේ වැඩපිළිවෙළක් සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙන අතර ම ශ්‍රී ලාංකීය ජනතාව නව දේශපාලන සංස්කෘතියක් තුළ ගොඩනැගීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ඇත.

කරුණු මෙසේ තිබියදී එක්සත් ජාතික පක්ෂයේ එක්තරා කල්ලියක් සුපුරුදු පරිදි ම පටු අවස්ථාවාදී දේශපාලනයේ නිරත වෙමින් පක්ෂ නායකයා විසින් ප්‍රසිද්ධියේ කරනු ලබන ප්‍රකාශවලට පරස්පර වූ ක්‍රියාමාර්ගවල නිරත වීම කනගාටුවට කරුණකි. රජය ගෙන යන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් සාවද්‍ය මතවාද හා ප්‍රචාර මාධ්‍ය මගින් තහවුරු කරලීමට ගෙන යන්නා වූ ක්‍රියා කලාපය මෙයට කදිම නිදසුනකි.

බහුතරයක් එක්සත් ජාතික පක්ෂ නායකයන් පවා ඉතාමත් වගකීමෙන් කටයුතු කරන මොහොතක එම පක්ෂයේ ම සුළුතරයක් වූ ඇතැම් පිරිසක ගේ ක්‍රියාකලාපයන් නිසා අවස්ථාවාදී දේශපාලනය තවමත් එම පක්ෂය මුළුමනින් ම අතහැර දමා නොමැත්තේ ද යන සාධාරණ සැකයක් ජනතාව තුළ ජනිත වි ඇත. නැතහොත් "පක්ෂයට පෙර රට" යැයි සිතා මතා කටයුතු කරන එක්සත් ජාතික පක්ෂයේ බහුතරයක් යටපත් කරමින් කුඩා කල්ලියක් කඩාකප්පල්කාරී ක්‍රියාවක නිරත වී ඇත්තේ ද යන්න පවා පැහැදිලි නැත.

මෙවැනි ජාතික ව්‍යසනයක දි පටු දේශපාලන උවමනාවන් වෙනුවෙන් පෙළ ගැසී සිටින කුමන්ත්‍රණකාරී බලවේග පරාය කර මේ රට යළි ගොඩනැගීම සඳහා රටට දැයට ආදරය කරන සියලු සමාජ බලවේග එක් විය යුතු කාලය එළඹ ඇත. අප සැවොම තම තමන් ගේ නිල්, රතු, කොළ, කහ කබා හා ලාංඡන පසෙක ලා ශ්‍රී ලාංකිකයන් ලෙස ජාතික කොඩිය සෙවණේ ජාති, ආගම්. පක්ෂ බේදයෙන් තොර ව වසර කිහිපයකට හෝ පොදු න්‍යාය පත්‍රයක් යටතේ රට ගොඩනැගීම සඳහා ඒකරාශී විය යුතුව ඇත. නව දේශපාලන සංස්කෘතියක් පිළිබඳ ජනතාව ගේ සුභවාදී ප්‍රාර්ථනාවන් රට ගොඩනැගීම සඳහා අප පදනම් කර ගත යුතු ය.